# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2343/30 – 2023 අගෝස්තු මස 03 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොට්ඨාස අංක 3) රන්කොත්දිවල ගමෙහි පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අංක KE/MWN/2011/152 හා 2012.05.28 දිනැති පූගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර "A සහ B" වශයෙන් සඳහන් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.7181 ක් පමණ වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – රුක්අත්තනේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.2137**

උතුරට: කැබලි අක්ෂර B; නැගෙනහිරට: ඇළ; දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර B.

02. **කැබලි අක්ෂර 'B' – රුක්අත්තනේ කුඹුර, මීගස් කුඹුර, වත්තගේ කුඹුර, පල්කඩ කුඹුර, දෙබටාව කොහොලන්පැල, මුවන් කුඹුර, මලදූල්ල කුඹුර – ප්‍රමාණය: හෙක්. 3.5044**

උතුරට: ඇළ, දේවාලේ කුඹුරේ ඉන් නියර, පාලුවත්ත, ඇළ සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: ඇළ සහ වලව්වේ වත්ත; දකුණට: ඇළ, වලව්වේ වත්ත සහ මාර්ග( මා.සං.අ.); බටහිරට: මාර්ග (මා. සං.අ.) සහ ඇළ (වියළි).

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/10/2011/UDA/201.
2023 ජූනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 08 - 0024